දෙපාර්තමේන්තු චක්‍රලේඛ : 06/2024

මගේ අංකය:DAPH/AD/16/02/06
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
පේරාදෙණියේ දී ය.
2024.07. 15

පළාත් ප්‍රධාන ලේකම්වරුන් මගින්,
පළාත් විෂයභාර (පශු සම්පත්) ලේකම්වරුන් මගින්,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂවරුන්
පශු වෛද්‍යවරුන්

නව තාක්ෂණය හඳුන්වා දීම තුලින් කුඩා ගොවිපොළ, සුළු හා මධ්‍ය පරිමාණ කිරි ව්‍යවසායකයින් බවට පත්කිරීම

ජනාධිපති ලේකම් කාර්යාලය හා කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කෘෂිකර්ම නව්‍යකරණ ප්‍රතිපත්තිය යටතේ, ශ්‍රී ලංකාව තුල සමස්ථ කෘෂිකාර්මික ක්ෂේත්‍රයට නව තාක්ෂණය හඳුන්වා දෙමින් ඵලදායිතාවය ඉහල නංවා කෘෂි ව්‍යවසායකයින් බිහිකිරීම අරමුණු කරයි. (කැබිනට් මණ්ඩල පත්‍රිකා අංක අමප/24/0428/601/031 අනුව) කිරි නිෂ්පාදන ක්ෂේත්‍රය ඒ අතර ප්‍රමුඛ ස්ථානයක් ගනී.

02. ලංකාවේ වාර්ෂික කිරි අවශ්‍යතාවය ලීටර් මිලියන 1200 ක් පමණ වේ. නමුත්, දේශීය නිෂ්පාදනය සාමාන්‍යයක් ලෙස ලීටර් මිලියන 400 ක් පමණ වේ. මේ අනුව අවශ්‍ය නොනිමි ප්‍රමාණය වන ලීටර් මිලියන 800 පියවා ගැනීමට වාර්ෂිකව කිරි හා කිරි නිෂ්පාදන ලීටර් මිලියන 750-800 ක් පමණ ආනයනය කරනු ලැබේ. මේ සඳහා 2023 වසරේ වියදම් කල විදේශ විනිමය ප්‍රමාණය රුපියල් බිලියන 70 ක් පමණ වේ. දැනට දේශීය කිරි කර්මාන්තයේ පවතින පහත ගැටළු මහහරවා ගනිමින් කිරි නිෂ්පාදන ඵලදායිතාවය ඉහළ නැංවීමේ හා සුළු හා මධ්‍ය පරිමාණ කිරි ගොවි ව්‍යවසායකයින් ඇති කිරීමේ අරමුණින් කෘෂිකර්ම නව්‍යකරණ වැඩසටහන මගින් කිරිගව ක්ෂේත්‍රය සඳහා නව්‍යකරණ වැඩසටහනක් සකස් කර ඇත.

ගැටළු: I. කිරි නිෂ්පාදන ගොවීන් බහුලවම යැපුම් මට්ටමේ පැවතීම
II. කිරි නිෂ්පාදන වර්ධන වේගය 4 - 5% වන අතර, අවශ්‍යතාවය සපුරා ගැනීමට 9 - 10 % වර්ධන වේගයක් අවශ්‍ය වීම.
III. නිෂ්පාදන ඵලදායිතාවය හා ලාභය පහල මට්ටමක පැවතීම.

03. කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම හා නිෂ්පාදන ඵලදායිතාවය වැඩි කිරීම සඳහා උපායමාර්ග 04ක් හඳුනා ගෙන ඇත. ඒවා නම්,

I. දැනට පවතින සුළු පරිමාණ යැපුම් මට්ටමේ පවතින ගොවිපල් වල නිෂ්පාදනය, කාර්යක්ෂමතාව ඉහළ දැමීම.
II. යැපුම් මට්ටමේ පවතින එහෙත් ඉහළ නිෂ්පාදන විභවතාවයක් ඇති තෝරාගත් ගොවිපල් වෙත නවීන තාක්ෂණික ක්‍රම හඳුන්වා දෙමින් ඵලදායිතාවය ඉතා ඉහළ මට්ටමකට ගෙන යාම (එක් සතෙකුගේ ගොවිපල දෛනික කිරි නිෂ්පාදනය - ලීටර් 100 හෝ ඊට වැඩි) මඟින් සුලු පරිමාණ කිරි ගොවි ව්‍යවසායක කණ්ඩායමක් බිහි කිරීම.
III. විශාල වාණිජ ගොවිපලවල් නියාමනය හා පහසුකරණය තුලින් ඵලදායිතාවය හා නිෂ්පාදනය ඉහළ නැංවීම.
IV. ඉතා විශාල ගොවිපලවල් නියාමනය හා පහසුකරණය තුලින් ඵලදායිතාවය හා නිෂ්පාදනය ඉහළ නැංවීම.

04. උක්ත උපායමාර්ග ලහා කර ගැනීම සඳහා යෝජිත ඉලක්කගත අරමුණු

I. දේශීය නිෂ්පාදනය 80% දක්වා ඉහළ නැංවීම.
II. කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම තුළින් ආනයනය 20% දක්වා අඩු කිරීම.
III. රාජ්‍ය, පුද්ගලික හවුල්කාරිත්ව වැඩසටහන් තුළින් නිෂ්පාදන කාර්යක්ෂමතාවය වැඩිකිරීම සහ කිරිගොවි ආදායම ඉහළ නැංවීම.
IV. දේශගුණ සුහුරු කිරිගව ගොවිපොළ ඇති කිරීම.

05. අදාල ඉලක්කයන් කරා ළඟාවීම සඳහා අවශ්‍ය වන උපාය මාර්ග අතුරින් දෙවන උපාය මාර්ගය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමට සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වේ. මෙහිදී දැනට යැපුම් මට්ටමේ සිටින නමුත් ව්‍යවසායකයින් බවට පත්කිරීමට හැකි ගොවීන් තෝරා ගෙන ඔවුන්ව

ව්‍යවසායකයින් බවට පත්කිරීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව 2024 වසර තුල දිනකට කිරි ලීටර් 40 ක් හෝ ඊට වැඩියෙන් ලබාගන්නා යැපුම් මට්ටමේ සිටින ගොවීන්, 850-1000 ක් පමණ තෝරාගෙන කිරි ලීටර් 100 ක ඉලක්කයකට ලඟා වී වසර දෙකක් තුළ ව්‍යවසායකයින් බවට සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වේ.

වාර්ෂික ඉලක්කයන් **ඇමුණුම 01** මගින් දැක්වේ.

06. මෙම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ දී සමස්ත පශු සම්පත් ක්ෂේත්‍රයේ ප්‍රජාව විසින් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පිළිබඳ මාර්ගෝපදේශ සහිතව මෙම දෙපාර්තමේන්තුව මෙම වක්‍රලේඛය නිකුත් කරනු ලැබේ. මෙහිදී සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මධ්‍යම රජය, පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හා කිරි නිෂ්පාදනය හා එකතු කිරීමේ නිරත පුද්ගලික ආයතන ඇතුලත් වේ.

1. පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ කාර්යභාර්යය
   i. සුදුසු ගොවීන් තෝරාගැනීම, ගොවීන් සඳහා පශු වෛද්‍ය කාර්යාල මඟින් ලබාදිය හැකි යෙදවුම් ලබාදීම, ප්‍රාදේශීය මට්ටමේ තාක්ෂණික දායකත්වය ලබාදීම.
   ii. ප්‍රගතිය මෙම දෙපාර්තමේන්තුව වෙත වාර්තා කිරීම.
   iii. වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී පළාත් මට්ටමේ නායකත්වය ලබාදීම.

2. පශු වෛද්‍ය කාර්යාල වල කාර්යභාර්යය

පියවර I - සුදුසු ගොවීන් හඳුනා ගැනීම, ගොවිපල තොරතුරු රැස් කිරීම සහ ගොවීන් පුහුණු කිරීම.

I. සුදුසු ගොවීන් හඳුනාගැනීම
පශු වෛද්‍ය කාර්යාල මඟින් පහත සඳහන් නිර්ණායක වලට අනුව ගොවිපොළ තෝරා ගත යුතුය.

- ✓ 2024 වර්ෂය සඳහා ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාලයේ ලියාපදිංචි ගොවිපලක් වීම
- ✓ ගවරැලේ සතුන් 15-20 ප්‍රමාණයක් සිටීම (පහතරට සතුන් 15 - 20 සහ උඩරට සතුන් 12 -15)
- ✓ ප්‍රදේශයට ගැලපෙන ජානමය හැකියාවක් ඇති සතුන් සිටීම
- ✓ තෘණ වගා කිරීමට අවම අක්කරයක පමණ ඉඩමක් සපයා ගත හැකි වීම
- ✓ වසර පුරා ජලය ලබාගැනීමේ පහසුකම් තිබීම
- ✓ ව්‍යවසායක මට්ටමට ළඟා වීමට කැමති ගොවියෙකු වීම (ප්‍රධාන ආදායම් මාර්ගය නම් වඩා සුදුසුයි)
- ✓ සූක්ෂම හෝ අර්ධ සූක්ෂම පාලන ක්‍රම සහිත ගොවිපලක් වීම.

II. සත්ත්ව සංවර්ධන උපදේශකවරුන් අතර ගොවිපල සංඛ්‍යාව බෙදා දීම (එක් නිලධාරියෙකුට 5 - 25 අතර)
III. තෝරාගත් ගොවීන් කැඳවා පශු වෛද්‍ය කාර්යාල මට්ටමින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
IV. ක්ෂේත්‍රයට ගොස් කිරි ගොවිපල මූලික සමීක්ෂණ ආකෘති පත්‍රය අනුව ගොවිපල තොරතුරු රැස් කිරීම.
V. ආකෘතියෙන් ලබාගත් තොරතුරු ලාභ පාඩු ගිණුම සහ ගොවිපොළ අධීක්ෂණ මෘදුකාංගයේ (farm monitoring tool - Excel) පළමු කාර්තුවට අදාල දත්ත පද්ධතියට ඇතුල් කිරීම.
VI. පශු වෛද්‍ය කාර්යාලයට අදාල සියළු ගොවීන්ගේ දත්ත ඇතුළු කල පසු එම දත්ත, පළාත් අධ්‍යක්ෂ කාර්යාලයේ සම්බන්ධීකරණ කරන නිලධාරියා වෙත විද්‍යුත් තැපෑල (e mail) මඟින් යැවීම.
VII. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධන අංශය මඟින් ලබාදී ඇති මොඩියුලය භාවිතා කර ගොවීන් පුහුණු කිරීම.
VIII. පශු වෛද්‍ය නිලධාරීන් සහ සත්ත්ව සංවර්ධන උපදේශකවරුන් සේවාවන් ලබාදීමට ගොවිපලට යන සෑම විටකම ගොවීන් ඒ සඳහා මෙහෙයවීම හා පෙලඹවීම.
IX. අවශ්‍ය නම් මොඩියුලය භාවිත කර ගොවි පුහුණු සැසි පැවැත්වීම. (මෙම මොඩියුලය සම්බන්ධව නිලධාරීන් දැනුවත් කර ඇත.)

පියවර II - එක් එක් ගොවිපල සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම.

I. පශු වෛද්‍ය කාර්යාලයේ නිලධාරීන් සහ කිරි එකතු කිරීමේ ආයතනයේ නිලධාරීන් එක්ව එකම දිනයක ගොවිපල වෙත ගොස් ගොවි මහතා සමඟ ගොවිපල දියුණු කරන ආකාරය පිළිබඳව සාකච්ඡා කිරීම.

II. ගොවිපල ඉදිරි පළමු වසර හා දෙවන වසර තුළ ළඟාවීමට බලාපොරොත්තු වන ඉලක්ක සකස් කර ගැනීම.
III. එම ඉලක්ක කරා ළඟාවීමට අවශ්‍ය ක්‍රියාකාරකම් හඳුනාගැනීම.
IV. එම ක්‍රියාකාරකම් සඳහා මුදල් සපයා ගන්නා ආකාරය නිශ්චය කරගැනීම.
V. එම ක්‍රියාකාරී සැලැස්ම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් සකස් කළ ගොවිපල ක්‍රියාකාරී සැලැස්මේ ආකෘතියට අනුව සැකසීම.
VI. එක් ආකෘතියක් ගොවියාට ලබාදී එහි පිටපතක් නිලධාරියා ළඟ තබාගැනීම. (මෙම ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම පිළිබඳව නිලධාරීන් පුහුණු කර ඇත.)
VII. ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට සහභාගී වූ සියලුම නිලධාරීන්, ගොවීන් එම ඉලක්ක කරා ළඟාවීමට අදාලව ක්‍රියාකාරකම් සිදුකරන බවට පසු විපරම් කිරීම, පසුව වෙනස් කළයුතු ස්ථාන ඇත්නම් සාකච්ඡා කර වෙනස් කිරීම.
VIII. මාස 06 කට පසු ගොවිපල මෙහෙයුම් මෙවලම් (Monitoring Tool) මගින් දත්ත එකතු කිරීම.
IX. දත්ත විශ්ලේෂණය කිරීම.
X. වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය මට්ටමේ නායකත්වය ලබාදීම.

3. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මෙම ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කරන ආයතනය වන අතර ජාතික මට්ටමේ නායකත්වය සහ ක්‍රියාකාරිත්වය පවත්වා ගනියි. වෙනත් රාජ්‍ය ආයතන, පුද්ගලික ආයතන, රාජ්‍ය නොවන සංවිධාන හා බැංකු මනා සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම මගින් මෙම ව්‍යාපෘතියට අවශ්‍ය යෙදවුම් තොරතුරු හා සේවාවන් ලබාගැනීම සහ මෙම ගොවිපල ඍජුවම අධීක්ෂණය කිරීමද දෙපාර්තමේන්තුව විසින් සිදුකල යුතු වේ.

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ (මධ්‍යම රජය) තාක්ෂණික අංශ හා ඒවායින් ක්‍රියාත්මක ව්‍යාපෘති මගින් ලබාදෙන දායකත්වය.

I. ජාතික කෘතිම සිංචන සේවාව හරහා මෙරට නිෂ්පාදිත අධිශීත ගව ශුක්‍ර හා ආනයනික ගව ශුක්‍ර ලබාදීමේදී තෝරාගත් ගොවීන් හට ප්‍රමුඛතාවය ලබාදීම.
II. කෘතිම සිංචන ශිල්පීන් පුහුණු කර ඔවුන් ප්‍රමාණාත්මකව වැඩිකිරීම තුලින් තෝරාගත් ගොවීන්ට සේවා සැපයීම පුළුල් කිරීම.
III. සත්ත්ව ආහාර ප්‍රභවයන් වැඩිදියුණු කිරීම - උසස් තත්වයේ තෘණ දඬු හා තාක්ෂණික සහය ලබාදීම.
IV. කාලගාත්‍රා, ගව රක්තාශ්‍රව රෝග එන්නත් නිෂ්පාදනය කර නොමිලේ බෙදාහැරීම.
V. කුර හා මුඛ රෝග එන්නත නිෂ්පාදනය කර පහසු මිලකට ගොවීන්ට ලබාදීම.
VI. කුර හා මුඛ, කාලාගාත්‍රා හා ගව රක්තාශ්‍රව රෝග සඳහා නොමිලේ සතුන් එන්නත්කරණය.
VII. බුරුළු නික්ෂේපණ නිෂ්පාදනය කර ගොවීන් වෙත ලබාදීම සඳහා විශේෂ වැඩසටහනක් සකස් කර ක්‍රියාත්මක කිරීම.
VIII. සත්ත්ව සෞඛ්‍ය, අභිජනන සහ තත්ත්ව ආරක්ෂණ වැඩසටහන් වලට උපකාරී වීම සඳහාත්, සතුන්ගේ නිෂ්පාදන හැකියාව මැනගැනීමේ පහසුව සඳහාත් සතුන්ගේ කන් සලකුණු කිරීම සඳහා විශේෂ වැඩසටහනක් සකස් කර ක්‍රියාත්මක කිරීම.
IX. ගොවීන් පාදක කරගත් පර්යේෂණ සිදුකිරීම සහ සතුන්ගේ ලෙඩරෝග මර්දනය කිරීමට අදාල පර්යේෂණ සිදුකිරීම.
X. සත්ත්ව රෝග හා සත්ත්ව ආහාර සඳහා පරීක්ෂණාගාර සේවා සැපයීම.
XI. සත්ත්ව ආහාර වල ගුණාත්මකභාවය තහවුරු කරගැනීම සඳහා අදාළ විශ්ලේෂණ හා අධ්‍යයනයන් සිදුකර දීම.
XII. ව්‍යාප්ති සේවා කවුළුව හරහා මුළු දිවයිනම ආවරණය වන පරිදි තාක්ෂණික පණිවිඩ ලබාදීම.
XIII. පශු වෛද්‍ය කාර්යාල වලට ඉලක්ක ලබාදීම සහ වැඩසටහන සම්බන්ධීකරණය සඳහා කමිටු පිහිටුවීම.
XIV. මෙම ගොවිපොළ අධීක්ෂණය කිරීම සහ ගොවිපොළ දත්ත විශ්ලේෂණය කිරීම මගින් එක් එක් ගොවිපොළ වල ගැටළු හඳුනාගෙන, එම ගැටළු නිරාකරණයට අවශ්‍ය තාක්ෂණික දැනුම ලබාදීම.
XV. කිරි අස්වනු ජංගම දුරකථන මෘදුකාංගය කිරි ගොවීන් වෙත හඳුන්වා දීම.

4. කිරි එකතු කිරීමේ ආයතන වල කාර්යභාර්යය

I. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව පළාත් දෙපාර්තමේන්තු සමඟ සම්බන්ධවී ව්‍යාපෘතිය සඳහා ගොවීන් තෝරාගැනීමට සහයෝගය ලබාදීම.
II. ගොවීන්ට අවශ්‍ය සේවා සැපයීම සඳහා හවුල්කාරිත්වය සැපයීම.

III. අවශ්‍ය අවස්ථාවන් වලදී ගොවීන්ට මූල්‍යමය සහයෝගය ලබාදීම.
IV. කිරි එකතු කිරීමේ ජාලය ශක්තිමත් කිරීම.
V. වාර්තාකරණය

07. කිරිගව ක්ෂේත්‍ර සංවර්ධනය සඳහා රාජ්‍ය (ජාතික/පළාත්), පුද්ගලික, රාජ්‍ය නොවන සංවිධාන හා විදේශ ව්‍යාපෘති වලින් වෙන්වන කවර හෝ ප්‍රතිපාදන මෙම උපායමාර්ගික සැලැස්මට අනුව යෙදවීම මගින් වඩාත් ඵලදායී කිරි නිෂ්පාදන ක්ෂේත්‍රයක් නිර්මාණය කිරීම මෙම චක්‍රලේඛය මගින් බලාපොරොත්තු වේ.

08. මෙම වැඩසටහන සඳහා අදාල වන සියලු ආකෘති පත්‍ර මේ සමඟ අමුණා ඇති කේතය (QR Code) ඔස්සේ බාගත කරගත හැකිය. මෙම වැඩසටහන සම්බන්ධ තොරතුරු පහත දුරකථන අංක ඇමතීමෙන් ලබාගත හැක.

i. පශු ව්‍යාප්ති තොරතුරු කේන්ද්‍රය - 081 2320320
ii. ව්‍යවසායකත්ව සංවර්ධන හා ආයෝජන සංවර්ධන ඒකකය - 081 3168595

09. ජාතික කිරි නිෂ්පාදනය වැඩි කිරීමේ ඉලක්ක සාක්ෂාත් කර ගැනීම උදෙසා යාවත්කාලීන කරන ලද දත්ත පද්ධතියක් තම කාර්යාලය තුළ පවත්වා ගැනීමෙන් ගොවීන් වෙත ලබාදිය යුතු තාක්ෂණික උපදෙස්, රජයේ ප්‍රතිලාභ, ණය යොජනා ක්‍රම හා රක්ෂණාවරණ වැනි විවිධ සේවාවන් කඩිනම් කිරීම අපේක්ෂා කෙරෙන බැවින් සියලු නිලධාරීන් මේ සඳහා ප්‍රමුඛත්වය දී කටයුතු කළයුතු අතර උපරිම දායකත්වය ලබාදෙමින් කැපවීමෙන් යුතුව කටයුතු කරන ලෙස වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

ආචාර්ය කේ.ඒ.සී.එච්.ඒ. කොතලාවල
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :-

01. ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය - කාරුණික දැ.ගැ.ස
02. ලේකම්, කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය - කාරුණික දැ.ගැ.ස
03. අතිරේක ලේකම් (පශු සම්පත් සංවර්ධන), කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය - කාරුණික දැ.ගැ.ස
04. සියලුම දිස්ත්‍රික් ලේකම්වරු - දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ සාකච්ඡා කිරීම සඳහා
05. සියලුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් - කාරුණික අ.ක.ස
06. සියලුම අධ්‍යක්ෂවරුන් /රෙජිස්ට්‍රාර් (සත්ත්ව ආහාර /පශු ඖෂධ) - කාරුණික අ.ක.ස
07. ප්‍රධාන ගණකාධිකාරී / ප්‍රධාන අභ්‍යන්තර විගණක / ඉංජිනේරු - කාරුණික අ.ක.ස
08. විශේෂඥවරුන් / ප්‍රධාන විද්‍යාඥවරුන් - කාරුණික අ.ක.ස
09. ප්‍රධාන සත්ත්ව නිරෝධායන නිලධාරී / පශු විමර්ශන නිලධාරීන් - කාරුණික අ.ක.ස

ඇමුණුම 01

ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා වන සැලැස්ම (2024-2048)

	වර්තමාන තත්වය	ඉලක්කය (2048)	ඉලක්කය		
			කෙටි කාලීන (2024-2028)	මධ්‍ය කාලීන (2029-2038)	දිගු කාලීන (2039-2048)
වාර්ෂික කිරි නිෂ්පාදනය	ලී. මිලියන 376	ලී. මිලියන 1,500	ලී. මිලියන 600 (40%)	ලී. මිලියන 1,125 (75%)	ලී. මිලියන 1,500 (100%)
දේශගුණ සුහුරු කිරිගව ගොවිපොළ ඇති කිරීම		ගොවිපල 50,000	ගොවිපල 2,500 (5%)	ගොවිපල 12,500 (25%)	ගොවිපල 50,000 (100%)

	වර්තමාන තත්වය	**2024**	**2025**	**2026**	**2027**	**2028**
අපේක්ෂිත මුළු කිරි නිෂ්පාදනය (ලීටර් මිලියන)	333.4	358.8	387.4	449	527.3	631.7
කිරි නිෂ්පාදනය වර්ධනය වීමේ ප්‍රතිශතය		7.6%	8%	15.9%	17.4%	19.8%
1. දිනකට කිරි ලීටර් 100 ක් හෝ ඊට වැඩියෙන් ලබාගැනීමට විභවතාවයක් ඇති ගොවිපළ ගණන	**228**	**850**	**1500**	**3000**	**4000**	**5000**
ගොවිපලක සිටින සතුන් ප්‍රමාණය	20	15	15	15	15	15
කිරි ලබාදෙන දෙනුන්ගේ ප්‍රතිශතය	50	60	60	60	65	70
එක් සතෙකු ලබා දෙන කිරි ප්‍රමාණයේ සාමාන්‍ය අගය	6	8	8	9	10	10
වාර්ෂික කිරි නිෂ්පාදනය (ලීටර් මිලියන)	**5**	**22.3**	**39.4**	**88.7**	**142.4**	**191.6**
2. විශාල පරිමාණ වාණිජ ගොවිපළ ගණන (සතුන් 100 - 1000)	**10**	**13**	**18**	**20**	**25**	**25**
ගොවිපලක සිටින සතුන් ප්‍රමාණය	500	300	300	350	400	500
කිරි ලබාදෙන දෙනුන්ගේ ප්‍රතිශතය	50	55	55	60	70	70
එක් සතෙකු ලබා දෙන කිරි ප්‍රමාණයේ සාමාන්‍ය අගය	8	10	10	12	13	15
වාර්ෂික කිරි නිෂ්පාදනය (ලීටර් මිලියන)	**7.3**	**7.8**	**10.8**	**18.3**	**33.2**	**47.9**
3. මහා පරිමාණ වාණිජ මට්ටමේ ගොවිපළ ගණන (සතුන් >1000)	**3**	**3**	**3**	**3**	**3**	**5**
ගොවිපලක සිටින සතුන් ප්‍රමාණය	2200	1800	1800	1800	1900	2000
කිරි ලබාදෙන දෙනුන්ගේ ප්‍රතිශතය	50	70	70	70	70	75
එක් සතෙකු ලබා දෙන කිරි ප්‍රමාණයේ සාමාන්‍ය අගය	20	20	24	26	30	30
වාර්ෂික කිරි නිෂ්පාදනය (ලීටර් මිලියන)	**24.1**	**27.6**	**33.1**	**35.9**	**43.7**	**82.1**
4. යැපුම් මට්ටමේ පවතින සුළු පරිමාණ ගොවිපළවල වාර්ෂික කිරි නිෂ්පාදනය (ලීටර් මිලියන)	**297**	**301**	**304**	**306**	**308**	**310**
ඉහත ගොවිපළ කාණ්ඩ 4 න් අපේක්ෂිත මුළු කිරි නිෂ්පාදනය (ලී. මිලියන)	333	359	387	449	527	632
අපේක්ෂිත වාර්ෂික මී ගව කිරි නිෂ්පාදනය (ලී. මිලියන)	50	50	50	50	50	50
අපේක්ෂිත මුළු කිරි නිෂ්පාදනය (ලී. මිලියන)	**383**	**409**	**437**	**499**	**577**	**682**